Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

නාඩගම් සම්භවය පිළිබඳ පවතින මතිමතාන්තර

- නාඩගම් නාට්‍ය බටහිර oppera නම් වූ ගීත නාටක විශේෂයටත් පීකිං ගීත නාට්‍යයටත් සමාන කළ හැකි බව එදිරිවීර සරච්චන්ද්‍රයෝ පවසති .
- මදුරාසියේ මුද්‍රිත **පේරගත්තිය තිරට්ටු** ග්‍රන්ථයේ දැක්වෙන්නේ නාඩගම් වූ කලී සංගීතය අභිනය අලංකාරම් රිද්මය හා නව රසය ආදියෙන් සමන්විත වූ රංග ක්‍රමයක් බවයි.
- ද්‍රවිඩ විශ්ලේෂණ අනුවඑස් විද්‍යානන්දන් මහතා දක්වන්නේ නාඩගම් යනු කූත්තු නම් වූ නාටක විශේෂයක් බවයි.
- මහාචාර්ය ඇම් එච් ගුණතිලක මහතා පවසන්නේ ක්‍රිස්තියානි මිෂනාරීන් ගේ ආගම ප්‍රචාර වල ප්‍රතිඵලයක් ලෙස නාඩගම් සම්ප්‍රදාය නම් දියුණු නාටක ක්‍රමයක් බිහි වූ බවයි .
- මහාචාර්ය සරච්චන්ද්‍ර පවසන්නේ දක්ෂිණ භාරතයේ තෙරුක්කූත්තු නාට්‍ය ඇසුරින්බිහි වී මුලින් මඩකළපු ආදී දෙමළ ප්‍රදේශ වල කතෝලික ජනයා භාවිතා කර පසුව දකුණට සංක්‍රමණය වී සිංහල සංස්කෘතියට අනුව හැඩ ගැසී ඇති බවයි .
- ජනප්‍රවාදයට අනුව නාඩගම් ලක්දිවට ගෙන එනු ලැබුවේ සිංහල රාජවංශයේ අන්තිමයා වූ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාගේ කාලයේය.රජු විසින් සරණ පාවා ගන්නා ලද මදුරාපුර නායක්කාර වංශික රාජ කුමාරිකාවක සමග ලක්දිවට පැමිණි පිරිස අතර සිටි අලගනායිදු නම් ආන්ධ්‍ර නාඩගම් විශේෂඥයා මේ රටේ නාඩගම් ප්‍රචලිත කරන්නට ඇතැයි විල්මට් පී විජේතුංග මහතා විසින් රචිත ස්වර ලිපි සහිත නෘත්‍ය ගීත නම් කෘතියේ සඳහන් වේ .

රංග ශෛලිය

සන්ධ්‍යා භාගයේ ආරම්භ වන නාඩගම් නාට්‍ය වලට සුවිශේෂ වූ රංග ශෛලියක් ඇත.එනම්,

- පූර්ව රංගය(පළමු වන භාගය)
- මෙහි දී බහුබූතයා ,සෙල්ලම් ළමා, බෙර කාරයින් ,දේශන වාදීන් ආදී පාත්‍ර වර්ගයාගේ නැටුම් ගැයුම් ආදිය පූර්ව රංග යෙදී ඉදිරිපත් කෙරේ.

- .පොතේ ගුරුගේ ප්‍රාරම්භක ගීතයෙන් ඉෂ්ට දේවතාවා නමස්කාරය සිදුකෙරේ .
- පොතේ විරිඳු වෙන් කතා වස්තුව කෙටියෙන් සාරාංශ කොට කීම සිදුකරයි.
- ඉන්පසු රංගනය විකාශනය කිරීම සිදුවේ.පළමුව සබයට එන්නේ බහුබූතයාය .ඔහු විකට වේශයෙන්ප්‍රේක්ෂකයා පිනවයි.
- ඊළඟට සෙල්ලම් ළමා වැනි අනෙක් පාත්‍රයෝපැමිණෙති. මෙම චරිත ප්‍රධාන කතාවට ඍජු සම්බන්ධයක් නැති නමුත් ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගනිමින් රංගනයේ යෙදෙති.
- ඊළඟට පැමිණෙන්නේ හඬ දූතයෝ ය.
- රජු සබයට වඩින බව ඔවුහු පවසති.
- ඒ සමගම රජු පැමිණෙයි.
  දෙවන භාගය - කතා වස්තුව ඉදිරිපත් කිරීම
  - නළුවන්ගේ මාර්ගයෙන් කතා වස්තුව විකාශනය කෙරේ .රංගනය අවසානයේ මංගලම් ගීතයෙන් නාට්‍ය අවසන් වේ .
  - නාඩගම සම්පූර්ණයෙන්ම කවි වලට සමාන තාල රහිත පද්‍ය ගායනා සහ තාල සහිත සින්දු සමඟ නැටුම් විලාසයකින් ඉදිරිපත් කෙරේ .
  - පැරණි නාඩගම් ආරම්භයේ දී කඩතුරාව විවෘත වන තෙක් මද්දල වාදකයෝ දෙදෙනෙක් අඩු තාල වැඩි තාල වැයීම මගින් නාඩගම් ආරම්භ කිරීමට යන බව ප්‍රේක්ෂකයාට ඇඟවීම සිදු කරයි.මෙය **අන්තාදිය** යනුවෙන් හැඳින්වෙයි.
    පසන්,තිර්ලානා,වඩිමුඩි,කීර්තනම්

ආදී සෑම තාල වලටම අයත් පද වැයීම මෙහිදී සිදුවේ .

නාඩගම් සඳහා භාවිත වන වාද්‍ය භාණ්ඩ

- මද්දල (ප්‍රධාන වාද්‍ය භාණ්ඩය)
- හොරණෑව
- කයිතාලම්
- වයලීනය
- සර්පිනාව
  නාඩගම් රචකයෝ කිහිපදෙනෙක්
  1පේදුරු සිංඤ්ඤෝ
  2පිලිප්පු සිඤ්ඤෝ
  3වී ක්‍රිස්තියන් පෙරේරා
  4 මිහිඳුකුලසූරිය ගාබ්‍රියෙල් ප්‍රනාන්දු
  5 හෙන්ද්‍රික් ආබ්රේව් රාජපක්ෂ

6 ළිඳමුලගේ ස්ටීවන් සිල්වා
7සයිමන් සිල්වා
8 ගාර්දියේ වසම්
9 එල් මරියානු ප්‍රනාන්දු
10 නාවුල්ල පුවානිස් පෙරේරා
11 පී ඇම් ඩී සිල්වා
12 චාල්ස් ආබ්‍රේව්
13 ජයමාන්න ආරච්චිගේ
14ජේම්ස් අප්පුහාමි
15 එම් ජෝන් සිංඤ්ඤෝ
නාඩගම් හා කෝලම් අතර සම්බන්ධය

- සම්ප්‍රදාය දෙකම මුහුදුබඩ ප්‍රදේශවල ප්‍රචලිත වීම
- නාඩගම් පොතේ ගුරු චරිතය හා කෝලම් කාරියකරවන රාළ චරිතය අතර සමානතා තිබීම.
- නාඩගම් සහ කෝලම් වල කතා පුවත් රඟ දැක්වීම
- සම්ප්‍රදායේ දෙකෙහිම පොතේගුරු/ කාරියකරවන රාළ විසින් චරිත හඳුන්වාදීම
- ආකෘතික වශයෙන් සම්ප්‍රදාය දෙකෙහිම පූර්ව රංගනය දක්නට ලැබීම.
- කෝලම් හා නාඩගම් අතර චරිත හා සිද්ධි වර්ණනය අතින් සමාන බවක් දක්නට ඇත.
- අණබෙරකරු ගේ චරිතය කෝලම් හා නාඩගම් දෙකටම පොදු වූවකි.එහෙත් ඒවායේ වර්ණනා වෙනස්ය.
- ඇතැම් නාඩගම්වල යොදාගත් භාෂාව දකෝලම් නාටක සිහිපත් කරවයි.කෝලම් චරිත සඳහා යොදා ගන්නා ඇතැම් ඇඳුම් නාඩගම් වල එන චරිත වල මෙන් විදේශීය ගතියක් පෙන්වයි.රතු කබාය,පිහාටු තොප්පිය,බම්බු කලිසම ආදිය.
- මෙසේ නාඩගම් කීපයකත් කෝලම් නාටකයත් අතර සමානතා දක්නට ලැබුණත් ඇතැම් ප්‍රදේශවල කෝලම් හා නාඩගම් අතර සමානතා දක්නට නොලැබෙයි. කෙසේ වුවද නාඩගම් සඳහා කෝලම් වල ආභාෂය ලැබුණා යැයි නිසැකවම කිව නොහැකිය.
- පැරණිතම කතෝලික නාඩගම්වල ජය සහ ලෙන්චිනා හෝ චරිත වශයෙන් සඳහන් නොවේ.එම නාඩගම්වල කෝලන්දනා හෙවත්කෝලමාහෙවත් බහුබූතයා හෙවත් කෝනංගියා යන චරිතය වර්ණනා කිරීමේදී පිරිස හිනස්වන්නට වචන යොදාගෙන ඇත.

  උදා -
  අප්පා මුගේ අඩි කොප්පා රටේ සැටි
  සිප්පා සිරසයට කැප්පූ ලෙසේ
  වම් වූ පයට එසලගු ලවා මහ තම්බෝරු සේ

බඩ මෙන්න බලවු........

- අරක්කැමි වැනි චරිතද පැරණි  නාඩගම් වල දක්නට නැත.
- අණබෙරකරුගේ චරිතයෙන්  ලබාගන්නා සේවය පැරණි කතෝලික නාඩගම් වලත් බෞද්ධ නාඩගම්වලත්, කෝලම් වත් එක හා සමානය.
- ඇතැම්විට අණබෙරකරුගේ , හැඩරුව ඇඳුම් පිළිබඳ වර්ණනා වෙනස්ය .
- කතෝලික රචකයන්ගේ පැරණි නාඩගම් වල අණබෙරකරු වෙනුවට බෙර කාරයෝ,( ඇහැලේපොළ) ගණිතයන්,(අලෙසු) ගණිතයා( රාජ තුන් කට්ටුව) ආදී චරිත යොදා ගනී.සැරයටියක් ගෙන පැමිණෙන බව සඳහන් වන්නේ දකුණු පළාතේ නාඩගම්වල අනබෙරකාරයාව ර්ණනා කරන තැන්වල පමණි.
- නාඩගම් සබයට නිළියන් අවතීර්ණ වූයේ නැත. ස්ත්‍රී භූමිකාව රඟපාන ලද්දේ පුරුෂයන් විසිනි

පැවරුම

1 නාඩගම් රංග ශෛලියේ ලක්ෂන 4 ක් ලියන්න.

2 නාඩගම් රංග භූමිය නම් කරන්න

3 නාඩගම් චරිත කිහිපයක් නම් කරන්න.